# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

## සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකයඃ.................................... නමඃ...................................................

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය | I පත්‍රය | කාලය පැය 01යි. |

සැලකිය යුතුයි;

**i.** සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.

**ii.** අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

**iii.** ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

**iv.** එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. සුනිමල්ගේ ව්‍යාපාරයට **කණ කොකා හඬා** ඇති බව මව කීවා ය.
   1. දියුණුවට පත් වී 2. ගින්නට හසු වී
   3. සරු වී 4. විනාශය ළඟා වී

2. පුතා ඇමතිතුමාගේ දියණිය විවාහ කර ගත් නිසා නැන්දට **අං ඇවිල්ලා**
   1. ආඩම්බරයට පත් වෙලා 2. තරහා ගිහිල්ලා
   3. කනස්සල්ලට පත් වෙලා 4. පිස්සු හැදිලා

3. ඉඩම් ආරවුලට මැදිහත් වූ බාප්පා **බොර දියේ මාළු අල්ලන්න** සූදානම් වන බව මාමා කීය.
   1. සහයෝගය දක්වන්න 2. අහිංසකයන් පෙළන්නට
   3. අවධානමක් දක්වන්න 4. අවුල් සහගත අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නට

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. ලේඛන කාර්යන්හි ........................... පිළිබඳ සාධක හමුවන්නේ මහින්දාගමනයෙන් පසුව ය.
   1. ආරම්භය 2. ව්‍යාප්තිය
   3. තොරතුරු 4. සංවර්ධනය

5. කෙටිකතාවක තිබිය යුත්තේ මනා හේතුඵල සම්බන්ධතාවයක් මත ගොඩනැගුණු ..................................
   1. අරමුණකි 2. ශෛලියකි
   3. පරිකල්පනයකි 4. කතා වින්‍යාසයකි

6. ආදි කාලයේ පටන් ආගමික, දාර්ශනික ................................ ලේඛන ද සාහිත්‍ය ලෙස සලකයි.
   1. ප්‍රබන්ධාත්මක 2. දේශපාලනික
   3. විද්‍යාත්මක 4. සාමාජීය

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1. නිශ්පාදනය, පුස්තකය, විමර්ශනය , ප්‍රවණතා 2. කයෝර, සම්භාවනාව, පුස්ථකාලය, සම්භාව්‍ය
   3. සණ්ටාර, බහ්වර්ථ, විද්‍යමාන, පර්යේෂණ 4. අන්‍යෝන්‍ය, පරිවර්ථනය, යථාර්තය, ස්තම්භ

8. බොරුපන - කැකිරි - දේවාශිර්වාදය - කාව්‍ය යන වචනවල දෙවන අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

1. ඇදය, ඉස්පිල්ල, ඇලපිල්ල, ගයනුකිත්ත
2. කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල, යංශය
3. පාපිල්ල, කෙටි ඉස්පිල්ල, ඇදපිල්ල, යංශය
4. දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, ඇදපිල්ල, යංශය

9. 'සුරපති' යන පදයේ අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වන්නේ,

1. දන්තජ, මූර්ධජ, ඕෂ්ඨජ
2. මූර්ධජ, ඕෂ්ඨජ, තාලුජ
3. දන්තජ, තාලුජ, කණ්ඨජ
4. මූර්ධජ, කණ්ඨජ, තාලුජ

10. අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

1. සුන්දර, චමත්කාර, මධුර, වින්දන
2. ඉපනැල්ල, ගරාදිය, ණය, ශිරීල
3. කියුබාව, ජපානය, රුසියාව, ඔස්ට්‍රියාව
4. ගනුදෙනු, ගාස්තුව,ගෙවීම, ගණනය

11. අනුක්ත නාමපදයක් යෙදී නොමැති පිළිතුරු තෝරන්න.

1. අපි, කෙනෙක්, සේකරයන්, සමහරු
2. කාන්තාවක්, නිළියක, හෙදියක්, ගැහැනියක්
3. ගිරවු, ඇත්තු, රීතීන්, ඇතැම්හු
4. ඇතැමෙක්, අයෙක්, කිසිවෙක්, මොණරු

12. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

1. නිපාත - එවි, තුරු, සතුටු මෙන්
2. උපසර්ග - කුකවි, දුර්ගුණ, පිළිමල්, දුදන
3. අසම්භාව්‍ය ක්‍රියා- කීවොත්, නටද්දී, බලන, ගයන
4. යුගල පද - තැගිබෝග, අඩුමකුඩුම, අස්පස්, වංහු

13. පූර්ව ක්‍රියාවක් යෙදී නොමැති වාක්‍ය කුමක්ද?

1. හෙදිය බෙහෙත් දී තුවාලය වෙළුවා ය.
2. පහණ තියා බුදු සාධුට හිමිදිරියේ
3. සේවිකාව ගෙය අතුගා දොර වැසුවා ය.
4. සුදු පුතා අකුරු ලියා චිත්‍රය ඇන්දේ ය.

අංක 14 -16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

14. සුළි සුළඟක් කියන්නේ උණුසුම් **ජල පෘෂ්ඨය** මත ඇති වන නිවර්තන කුණාටුවක්.

1. ජල නිධිය
2. ජල වාෂ්ප
3. ජල තලය
4. ජල නලය

15. තමන් වහන්සේ බුදුන් කෙරෙහි **අවිනෂ්ට** ව කළා වූ මහ පෙම් වතුරු රඳවා ගත නොහී.........

1. විනාශ ව
2. විශ්වාස ව
3. විශ්වාස නොවූ
4. විනාශ නොවූ

16. පැසී ඉසත් නිකටත් **සොඬු** ඇකිල්ලේ

1. කන්දෙක
2. බෙල්ල
3. කට
4. කම්මුල

17. දී ඇති වචන ගොනු අතරින් එකිනෙකට සමීප කාර්යයන් සමග බැඳී නො පවත්නා පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

1. පිඟාන, වීදුරුව, තසීම, මුට්ටිය
2. සාරිය, ඔසරිය, ගවුම, හැට්ටය
3. නැව, ඔරුව, පාරුව, තෙප්පම
4. ලයිටරය. විදුලි බල්බය, ලාම්පුව, විදුලි පන්දම

18. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | |
|---|---|
| 1 | ප්‍රකාරය - පව්ව, මව- දිනිතිය, ජනක -පියා, මියුලැසි-දරු |
| 2. | ඔසු - ඖෂධ, සොළොස්- දහසය, ගැමි-ග්‍රාම්‍ය, මිදුල-මළුව |
| 3. | නල - පවන, දඹ-කෙසෙල්, නුබ-අඹර, අඹ-ජලය |
| 4. | සඳ - උතුම්, මහලු- වෘද්ධ, දත්-දසන්, සහසැස්-බ්‍රහ්ම |

19. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. යහළුවා- මිතුර, සකි, සගයා, මිත්‍රයා
2. ගැහැනිය- මහිලාව, ළඳ, ලලනා, අඟන
3. සකුණ- සියොත්, පක්ෂි, විහඟ, සකලයා
4. නෙළුම්- තඹර, ඇඹුල,පංකජ, පුෂ්කරණී

20. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

1.සංකීර්ණ- සරල 2. දුර්ලභ- සුලභ 3. ස්වාධීන-අස්ථාවර 4. ජනශූන්‍ය-ජනාකීර්ණ

21. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

1. 'තෝ ' යන්නෙහි ස්ත්‍රී ලිංග පදය වන්නේ 'තී ' යන්නයි.
2. ස්වර උච්චාරණයට ගත වන කාලය කෙටි ස්වරවලට වඩා සාපේක්ෂව අඩු ය.
3. 'නිර්ණායක' යන වචනයෙහි 'නිර්' යනු උපසර්ගය කි.
4. 'ෆ ' සංකේතයෙන් ඉංග්‍රිසි හා අරාබි භාෂාවන්හි හමු වන 'ෆ් ' ශබ්දය නිරූපණය වෙයි.

22. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි සම්භාව්‍ය ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.

1. යජාතලිවපු 2. දදෙඅනඹනිස්ස 3. සබුණරත්න 4. ශේරකායවයාඛ

23. නිවැරදිව විරාම ලක්ෂණ යොදා ඇති වරණය තෝරන්න.

1. "මමයි ", හැඩුවේ. ඒ හින්දා මගෙයි දරුවා!
2. අනඳ පහ වැ යා මා පෙරට නො සිට යි, වදාළෝ.
3. "මං තවත් නම් පෙත්සම් ලියන්නේ නැහැ". යි ඔහු කී ය.
4. හම්බන්තොට වැනි පෙදෙස්වල "ටක රං" බැඳීම ලෙස ද හඳුන්වයි.

24. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍ය තෝරන්න.

1. පිළිම ගෙය ලංකාවේ ආරාමයක අංගයක් වූයේ කවර කලක දී ද යනු මෙහිදී විමසිය යුතු කරුණකි.
2. "සිංහලයා ඉතා විනීත ය. ආගන්තුක සත්කාරයෙහි තත්පර ය. ස්වදේශීන් හට මෙන් ම කරුණාවෙන් විදේශීන් හටත් සලකන්නේ ය."
3. කෘෂිකාර්මික නොවන ජීවන වෘත්තීන්, හි නිරත වූ ජන කොටස් ද සමාජයක වෙසෙති.
4. වෙනකක් තබා අපේ ම පාසල හා විද්‍යාල අතලොස්සක්වත් අපට තිබේ ද?

- අංක 25 , 26 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

25. වාසි පැත්තට කවුරුත් හිතවත් ව කතා කිරීම

1. දී කිරට බළලුත් සාක්කි ලු. 2. උපන් ගෙයි සිරිත බලි ඇරියත් යන්නේ නැති ලු.
3. ගඟින් පැන් බී මුහුදට ආවඩන්නා සේ 4. කපන්න බැරි අත සිඹින්නා සේ.

26. අධමයන්ට උතුම් දෙයක් පලක් නැතිකම

1. කලුවා මාරපන් ගියා වගේ 2. ඌරෝ කවදා ද කහ කෑවේ
3. ගහේ කටු උල් කළ මනා ද 4. උඩින් මිතුරු යටින් හතුරු

27. A සබවස - සත්‍ය වචනය

B උපමා - අකාස්මිකව

C අහේතුකව - උවම්

D වාච්‍යාර්ථය - මතු පිට අර්ථය

A – B – C – D යෙදුම් යුගල අතුරෙන් නිවැරදි යුගල වන්නේ,

1. B හා C පමණි 2. B හා D පමණි 3. A හා D පමණි 4. A හා C පමණි

28. පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

E – පිළිබඳ , F – ගෙන් , G – වෙනුවෙන් , H - සේ

A ඇමතිතුමා පැවසූ කරුණු .................. වාද විවාද ඇති විය.

B රට , දැය , සමය ...................... කටයුතු කළ යුතු ය.

C පුංචි මැණිකා මුවැත්තියක ......................... කටයුතු කළා ය.

D චිකන්ගුන්යා රෝගය මදුරුවෙක් ............................ බෝ වෙයි.

1. H E G F 2. E G H F 3. E H G F 4. G H F E

- අංක 29- 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

29. 1. මම සේවයෙන් ඉවත් විය යුතු ය.
    2. ඇතැමෙක් පාඩම් වැඩ මග හරියි.
    3. වෛද්‍යවරු දෙදෙනෙක් රට හැර ගියේ ය.
    4. නදී තොමෝ සෙමින් ගලා බසින්නී ය.

30. 1. ජී. බී. සේනානායක විශිෂ්ට ලේඛකයකු වෙයි.
    2. සිසුහු අවංක නොවන්නේ ඇයි?
    3. ඇමතිවරුන් නිලධාරින් නොමග යවති'යි මහජනයෝ සිතුහ.
    4. අප මහණදම් පිරිය යුත්තෙමු.

31. "භවත් නාලාගිරිය, තා සොළොස් කළක් රා පොවා මත් කරන්නා හු ......"

    මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

    1. බුත්සරණ 2. අමාවතුර 3. පූජාවලිය 4. දහම්ගැට මාලය

32. පහත සඳහන් කවියේ තෙවන පාදය දක්වෙන වරණය තෝරන්න.

    එබසට ලජ්ජාවෙන් ලද බැමිණී
    අබ සැට ලාසක් පුපුරණ ලෙසිනී
    ................................................................................
    කල ගෙඩි බිඳගොස් තම ගෙට වැදුණී.

    1. මන් බොල තට දර දිය ද අදින්නී 2. කන් කටුවට කරදර තෙපලන්නී
    3. විළි වැද ඉවසා රොස් කොට එඩිනි. 4. මූණ රවා ගෙන ගොස් ගෙට වැදුණී

33. පහත සඳහන් චරිත අන්තර්ගත නිර්මාණය වන්නේ,

    **යසෝමා - විමල් - මහේන්ද්‍ර**

    1. අතීතයෙන් කතාවක් 2. මංතනන්නෝ 3. තොරොක්කෝව 4. සුනේත්‍රා

34. පහත සඳහන් කවි දෙපදයේ අර්ථය නිවැරදි ව දක්වෙන වරණය තෝරන්න.

    සිව් සඟරාවතින් දස රජ දමින් බැඳී
    සව් ලෝ සතට කුලුණින් සව් ඉසුරු දිදී

    1. සතර සංග්‍රහ වස්තුවලින් හා දස රාජ ධර්මයෙන් සැමට සියලු සම්පත් දෙමින්....
    2. සියලු දෙනාට ම සැප සම්පත් දෙමින් ධර්මයෙන් යුතුව පාලනය කරමින්
    3. යහපත් අයුරින් රාජ්‍ය පාලනය කරමින්
    4. සතර සංග්‍රහ වස්තුවලින් හා දසරාජ ධර්මයෙන් යුතුව
    සියලු ලෝක සත්ත්වයන්ට කරුණාවෙන් සව් සැප දෙමින්....

35. මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
    ඇත්තේ ඒ අභීත දූ පුතුන් .........

    මෙම ගීත කොටසේ සඳහන් කාව්‍යාලංකාරය වන්නේ,

    1. උපමාලංකාරය 2. රූපකාලංකාරය 3. උත්ප්‍රේක්ෂාලංකාරය 4. ව්‍යංගාර්ථය

36. එවන් ලෙයින් උපන් පුතේ
    සුරු විරුකම් ඔබට ඇතේ
    දෑ උරුමයඇතිව සිතේ
    මවුබිම දෙස බලන් පුතේ

    මෙම පද්‍ය නිර්මාණය කරන ලද්දේ,

    1. මහගමසේකර 2. එස්. මහින්ද හිමි 3. මඩවල එස්. රත්නායක 4. මොනිකා රුවන්පතිරණ

37. මනෝ ප්‍රනාන්දු මහතාගේ නිර්මාණයකින් උපුටා ගත් පාඨය ඇතුළත් පිළිතුර තෝරන්න.

1. "ඇයි නවතින්නේ අපි හොරෙන් ම පිටුපසින් යමු."
2. වෙරළ දිගේ සැරසිල්ලක් මෙන් හරිත වර්ණ ශාකයෝ පෙනෙන්නට වූහ.
3. මොන තරම් ප්‍රීතිමත් අපූරු ජීවිතයක් ද? ඕනෑම තැනක කැමති විදිහට ඇවිදින්න.
4. පසු දින රාත්‍රිය ද සඳ එළියෙන් ඉතා ම ප්‍රසන්න විය.

38. අප්පා උඹේ හොර දෙටුවා

අම්මා හරිම කුනකටුවා

ඒ හින්දා පුතේ උඹට

මුළු ලෝකෙ ම දණ නමාවී.

මේ ගීත කොටස ගයන්නේ,

1. කෝප්රල් 2. නටාලියා 3. හේවායා 4. ගෘෂා

39. ප්‍රාදේශීය ව්‍යවහාරවලට අනුව 'පුහුල් ' යනු,

1. වට්ටක්කා 2. අඹ 3. පැපොල් 4. කැකිරි

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

රටක ආර්ථිකයේ විශේෂ ස්ථානයක් වෙළඳාමට හිමි වන බව ධර්මපාලතුමාගේ අදහස විය. එබැවින් පාසලේ දීත් දරුවන්ට වෙළඳාම පිළිබඳ ඉගැන්විය යුතු ය.

1. රටක ආර්ථිකයේ විශේෂ ස්ථානයක් හිමි වනුයේ වෙළඳාමට ය.
2. ආර්ථිකයේ සුවිශේෂී ම ස්ථානය වන්නේ වෙළඳාම බැවින් එය ඉගැන්විය යුතු ය.
3. වෙළඳාම ආර්ථිකයට සුවිශේෂී බැවින් ඒ පිළිබඳ පාසල් අධ්‍යාපනය තුළින් දරුවන්ට ඉගැන්විය යුතු ය.
4. පාසල් අධ්‍යාපනය තුළින් මෙන් ම නිවසේ දී ද වෙළෙඳාම පිළිබඳ ඉගැන්විය යුත්තේ එය ආර්ථිකයට සුවිශේෂී බැවින් ය.